# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1901/19 - 2015 පෙබරවාරි මස 13 වැනි සිකුරාදා - 2015.02.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සුරාබදු ආඥාපනත

අංක 973 දරන සුරාබදු නිවේදනය

**අරක්කු හා බියර් නිෂ්පාදකයින් විසින් ගෙවිය යුතු අවම මාසික සුරාබද්ද**

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 28(අ) වගන්තිය සමඟ කියවනු ලබන 16(ඇ) වගන්තියෙන් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය රවි කරුණානායක වන මම, මෙම නිවේදනය මගින්, සියළුම අරක්කු හා බියර් නිෂ්පාදකයන් විසින් අවම වශයෙන් මසකට රුපියල් මිලියන 200ක සුරාබද්දක් ගෙවිය යුතු බවට නියම කරමි.

02. යම් මසකට අදාලව මෙම කොන්දේසිය නොසපුරවන අරක්කු හා බියර් නිෂ්පාදකයන්ගේ මත්පැන් නිෂ්පාදන බලපත්‍ර ඊළඟ මස 01 දා සිට අවලංගු වන අතර, මෙම ක්‍රියාවලිය 2015.04.01 දින සිට ක්‍රියාත්මක වේ.

රවි කරුණානායක,<br>
මුදල් අමාත්‍ය.

2015ක් වූ පෙබරවාරි මස 13 වැනි දින,<br>
කොළඹ,<br>
මුදල් අමාත්‍යාංශයේ දී ය.

03-78/1

---

### සුරාබදු ආඥාපනත

අංක 974 දරන සුරාබදු නිවේදනය

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය සමඟ කියවනු ලබන 25 වන වගන්තියෙන් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය රවි කරුණානායක වන මම, මෙම නිවේදනය මගින් අංක 1680/24 යටතේ 2010 නොවැම්බර් 19 වැනි දින අති විශේෂ ගැසට් පත්‍රයෙහි පල කරනු ලැබූ අංක 926 දරන සුරාබදු නිවේදනයේ ඡේද අංක 15, 16, 17, 18, 19, 20, 22, 23, 24, 25, 26, 27, 28, 29, 30, 33, 38 හා 43, 2015.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි හා "අ" උපලේඛනයේ සඳහන් පරිදි සංශෝධනය කරමි.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

තවද අංක 1708/16 යටතේ 2011.05.31 වැනි දින අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ අංක 936 දරන සුරාබදු නිවේදනයේ II කොටස 2015.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි හා "ආ" උපලේඛනයේ සඳහන් පරිදි සංශෝධනය කරමි.

2015 වර්ෂය සඳහා දැනටමත් බලපත්‍ර ලබා ගෙන ඇති ඉහත ගනයන්ට අයත් සියළු සුරාබදු බලපත්‍රධාරීන් ඉතිරි මුදල් 2015.03.31 දිනට පෙර ගෙවිය යුතු ය.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2015ක් වූ පෙබරවාරි මස 13 වැනි දින,
කොළඹ,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

"අ" උපලේඛනය

| I වන තීරුව | | II වන තීරුව | |
|---|---|---|---|
| අනු අංකය | බලපත්‍රයේ ස්වභාවය හෝ විස්තරය | වාර්ෂික බලපත්‍ර ගාස්තුව රුපියල් | ඇපය රුපියල් |
| 1 | මත්පැන් සඳහා තොග වෙළඳ බලපත්‍ර (ර. බි. 3) | 1,000,000 | 50,000 (අරක්කු සඳහා පමණි) |
| 2 | මත්පැන් සඳහා සිල්ලර බලපත්‍ර (ර. බි. 4) | | |
| | 1. මහ නගර සහා ප්‍රදේශ | 600,000 | 25,000 |
| | 2. නගර සභා ප්‍රදේශ | 400,000 | 25,000 |
| | 3. අනෙකුත් ප්‍රදේශ | 300,000 | 25,000 |
| | 4. ඉල්ලුම්කාර ව්‍යාපාරයේ/සමාගමේ හෝ එහි මව් ව්‍යාපාරයේ/සමාගමේ වාර්ෂික පිරිවැටුම රුපියල් දස ලක්ෂ 72 ඉක්මවන වෙළඳ සංකීර්ණ/වෙළඳ සැල් වැනි ආයතන සඳහා ඒවා පිහිටි ප්‍රදේශ නොසලකා දෙනු ලබන මත්පැන් සිල්ලරට විකිණීමේ බලපත්‍රය | 800,000 | 25,000 |
| 3 | හෝටල් බලපත්‍රය (ර. බි. 7) (සංචාරක මණ්ඩලය අනුමත කරනු ලැබූ) | | |
| | 1. කාමර 250ක් හෝ ඊට වැඩි | 1,000,000 | 5,000 |
| | 2. කාමර 200ක් හෝ ඊට වැඩි | 800,000 | 5,000 |
| | 3. කාමර 100ක් හෝ ඊට වැඩි | 450,000 | 5,000 |
| | 4. කාමර 50ක් හෝ ඊට වැඩි | 400,000 | 5,000 |
| | 5. කාමර 20ක් හෝ ඊට වැඩි | 350,000 | 5,000 |
| | 6. කාමර 20ට අඩු | 300,000 | 5,000 |
| | 7. සංචාරක මණ්ඩල අනුමැතිය රහිත හෝටල් කාමර 5 හෝ ඊට වැඩි | 300,000 | 25,000 |
| 4 | හෝටල් පීඨිකා බලපත්‍රය (ර. බි. 8) | | |
| | 1. මහනගර සභා ප්‍රදේශ | 100,000 | - |
| | 2. වෙනත් ප්‍රදේශ | 80,000 | - |
| | 3. සහායක බලපත්‍ර | 50,000 | - |

"අ" උපලේඛනය (සම්බන්ධිතයි)

| | I වන තීරුව | II වන තීරුව | |
|---|---|---|---|
| අනු අංකය | බලපත්‍රයේ ස්වභාවය හෝ විස්තරය | වාර්ෂික බලපත්‍ර ගාස්තුව රුපියල් | ඇපය රුපියල් |
| 5 | අවස්ථා බලපත්‍රය (දිනකට) (ර. බි. 14) (ඉල්ලුම් පත්‍ර ගාස්තු අය කරනු නොලැබේ) | 10,000 | - |
| 6 | විකුණන වේලාවන් දීර්ඝ කිරීමට අතිරේක බලපත්‍රය (ර. බි. 15) | | |
| | 1. මුල්පැය දෙක සඳහා පැයකට | 1,000 | - |
| | 2. ඊට වැඩිවන පැයකට (ඉල්ලුම් පත්‍ර ගාස්තු අය කරනු නොලැබේ) | 10,000 | - |
| 7 | සිනමා සඳහා විනෝද පීඨිකා බලපත්‍රය (ර. බි. 09) | 300,000 | 25,000 |
| 8 | තානායම් බලපත්‍රය (ර. බි. 12) | 300,000 | 25,000 |
| 9 | හෝජනාගාර බලපත්‍රය (සංචාරක මණ්ඩලය අනුමත කරනු ලැබූ (ර. බි. 11) | | |
| | 1. හෝජනාගාර ඒ ශ්‍රේණිය | 500,000 | 5,000 |
| | 2. හෝජනාගාර බී ශ්‍රේණිය | 400,000 | 5,000 |
| | 3. හෝජනාගාර සී ශ්‍රේණිය | 300,000 | 5,000 |
| | 4. සංචාරක මණ්ඩලය අනුමැතිය රහිත හෝජනාගාර (ඉල්ලුම් පත්‍ර ගාස්තු අය කරනු ලැබේ) | 300,000 | 25,000 |
| 10 | දුම්රිය හෝජනාගාර (ර. බි. 10) | 50,000 | 25,000 |
| 11 | හිමිකාර සමාජශාලා බලපත්‍රය (ර. බි. 13) | 800,000 | 25,000 |
| 12 | සාමාජිකයින් පමණක් වන සමාජශාලා (ර. බි. 13ඒ) සම්භාෂණ හා විනෝද කාර්යයන් සඳහා පිහිට වූ සමාජශාලා සඳහා වූ බලපත්‍රය | | |
| | 1. මහනගර සභා ප්‍රදේශ | 600,000 | 25,000 |
| | 2. නගර සභා ප්‍රදේශ | 400,000 | 25,000 |
| | 3. වෙනත් ප්‍රදේශ | 200,000 | 25,000 |
| 13 | ක්‍රීඩා සමාජ | | |
| | 1. මහ නගර සභා ප්‍රදේශ | 300,000 | - |
| | 2. නගර සභා ප්‍රදේශ හා වෙනත් ප්‍රදේශ | 200,000 | - |
| 14 | බියර්, ඒල්, ස්ටවුට් හා වයින් විකිණීම සඳහා විශේෂ බලපත්‍රය සිල්ලරට විකිණීම (ර. බි. 22ඒ) | 100,000 | 2,500 |
| | ස්ථානීය පරිභෝජනය (ර. බි. 22බී) (සංචාරක මණ්ඩල අනුමැතිය සහිත හා රහිත) | 150,000 | 2,500 |

"අ" උපලේඛනය (සම්බන්ධිතයි)

| | I වන තීරුව | II වන තීරුව | |
|---|---|---|---|
| අනු අංකය | බලපත්‍රයේ ස්වභාවය හෝ විස්තරය | වාර්ෂික බලපත්‍ර ගාස්තුව රුපියල් | ඇපය රුපියල් |
| 15 | වතු කැන්ටින් | | |
| | 1. (රා පමණක්) | 40,000 | 10,000 |
| | 2. අරක්කු හා රා | 100,000 | 10,000 |
| 16 | වයින් ස්ප්‍රීතු විකිණීම | 1,000 | |
| 17 | රා එකතු කිරීම් ස්ථාන බලපත්‍රය | 25,000 | |
| 18 | පානීය නොවන ස්ප්‍රීතු ආනයනය, ළඟ තබා ගැනීම හා විකිණීම සඳහා දෙනු ලබන බලපත්‍රය | 50,000 | - |

"ආ" උපලේඛනය

**මධ්‍යසාර භාවිතය සඳහා අය කරනු ලබන තුන් අවුරුදු ගාස්තුව**

| | බලපත්‍රයේ ස්වභාවය | තරු 3 සහ තරු 4 හෝටල් (රු. මිලියන) | තරු 5 හා ඊට ඉහළ ගණයේ හෝටල්/ බුටික් හෝටල්/බුටික් විලා/ පෞරාණික වැදගත් කමක් ඇති හෝටල් (රු. මිලියන) |
|---|---|---|---|
| 1. | කාමර 250 හෝ ඊට වැඩි | 6.0 | 10 |
| 2. | කාමර 200 හෝ ඊට වැඩි | 4.5 | 8 |
| 3. | කාමර 100 හෝ ඊට වැඩි | 3.5 | 6 |
| 4. | කාමර 50 හෝ ඊට වැඩි | 2.5 | 4 |
| 5. | කාමර 07 හෝ ඊට වැඩි | 1.5 | 2 |

03 - 78/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.